# SME

## කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුව







කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

# ස්තුති පිදුම...

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කිරිමෙහිලා මුදල් අමාත්‍යාංශය, ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාශය, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාශය, පරිසර අමාත්‍යාශය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පර්යේෂණ ආයතන, රාජ්‍ය හා පෞද්ගලික වාණිජ බැංකු, ජාතික හා ප්‍රාදේශීය වාණිජ මණ්ඩල, සහ Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) ආයතනයන් මගින් දුන් බුද්ධිමය දායකත්වය වෙත කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සිය කෘතවේදීත්වය පළකර සිටී.

තම අත්දැකීම් බෙදාගනිමින්, අදහස් යෝජනා ලබාදෙමින් පුද්ගලික අංශය ලබාදුන් දායකත්වයද මෙම ලේඛනයෙහි ගුණාත්මක බව ඔප් නැංවීම උදෙසා හේතුවූවා නිසැකය.

මෙකී කර්තව්‍ය සඵල කර ගැනිම උදෙසා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා ලබාදුන් මගපෙන්වීම පෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක චරිත රත්වත්ත මැතිතුමා විසින් මේ සම්බන්ධයෙන් දැක්වූ අතිමහත් උනන්දුවද මෙහිලා මහත් අගය කරනු කැමැත්තෙමි.

මෙම ලේඛනය මුද්‍රණය පිණිස GIZ ආයතනය ලබාදුන් සහයෝගයද කෘතඥපූර්වකව මෙහිලා සටහන් කරනු කැමැත්තෙමි.

දිනය - 2015.10.01

**ටී.එම්.කේ.බී.තෙන්නකෝන්**
**ලේකම්**
**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

## පටුන

පිටුව


**1.** හැඳින්වීම ........................................................................ 1

**2.** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය රාමුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු ........... 1

**3.** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳ නිර්වචනය .................................. 3

**4.** ඉහළ විභවයක් සහිත ඵලදායක පර්ෂද............................................... 4

**5.** ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සහ ක්‍රමෝපාය............................................ 5

අ. ව්‍යාපාර සඳහා හිතකර පරිසරය ................................................ 5

ආ. නවීන තාක්ෂණය භාවිතය................................................ ...... 6

ඇ. ව්‍යවසායකත්ව සංස්කෘතිය හා කුසලතා සංවර්ධනය ................................ 7

ඈ. මූල්‍ය පහසුකම් වෙත ප්‍රවිෂ්ඨය ............................................................ 8

ඉ. වෙළඳපල පහසුකම් සැලැස්වීම .................................................... 9

ඊ. පර්යේෂණ හා සංවර්ධනය ....................................................... 10

උ. සම්පත් කාර්යක්ෂමලෙස යෙදවීම................................................. 11

ඌ. ප්‍රාදේශීය සමබරතාව ................................................................ 12

**6.** ක්‍රියාත්මක කිරීමේ සංවිධිවිධාන ................................................ 12

අ. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සම්බන්ධීකරණය ..................... 12

ආ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය උපදේශක සභාව ................................ 13

ඇ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පර්ෂද කමිටු ...................................... 13

ඈ. නිරීක්ෂණය හා ඇගැයීම ................................................... 14

**7.** සමාප්තිය ........................................................................................ 14


වගු


වගු අංක I :ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිර්වචනය කිරීම ........................ 4


රූප සටහන්


රූප සටහන් අංක 1: කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමු න්‍යායසය...........................3

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුව**

## 1. හැඳින්වීම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ශ්‍රී ලංකා රජයේ සමස්ථ අරමුණ තුළ වැදගත් ක්‍රමෝපායික අංශයක් ලෙස හඳුනා ගෙන ඇති අතර, සියලු අංශ ඇතුලත් වන ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා උත්පාදනය හා දිළිඳුකම පහත හෙළීම සඳහා වූ වෙනසේ ගාමක බලය ලෙස සැලකේ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීම තුලින් පසුගාමී ආර්ථිකයන් නැග එන සමෘද්ධිමත් ආර්ථිකයන් බවට පරිවර්තනය කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SME) මුළු ව්‍යවසාය සංඛ්‍යාවෙන් 75% ක් වන බැවින්ද, රැකියාවන් ගෙන් 45% කට වැඩි ප්‍රමාණයක් සපයන බැවින් ද, දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 52% ක් හෝ ඊට වඩා වදායක වන බැවින්ද, ශ්‍රී ලංකා රජය එය මෙරට ආර්ථිකයේ කොඳුනාරටිය වශයෙන් සලකයි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය පුළුල් පරාසයක සර්ව-සාධාරණ සංවර්ධනය ප්‍රවර්ධනය කරන අතර එය මෙරට ආර්ථික සංවර්ධනයට සහභාගි වීමට කාන්තාවන්ට හා තරුණ තරුණියන්ට අවස්ථාව සලසා දෙයි.

ගෝලීයකරණ ප්‍රවණතාවත් සමගම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සැලකෙන්නේ හුදෙක් "ආරක්ෂණය හා ප්‍රවර්ධනය" සඳහා වූ අංශයක් ලෙස නොව, එයට වඩා වැදගත් "වර්ධනය හා සංවර්ධනය" සඳහා වූ ගාමක බලවේගයක් වශයෙන් ය. එම නිසා මතු වන අභියෝගයන්ට මුහුණ දෙනු පිණිස මෙම ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර තරගකාරිත්වය වර්ධනය කොට එය දියුණු වන ක්ෂේත්‍රයක් ලෙස සංවර්ධනය කිරීම මූලික වශයෙන් වැදගත් වන බව ශ්‍රී ලංකා රජය සලකයි.

මෙම අංශයේ ස්වභාවය හා එය මුහුණ දෙන අභියෝගයන් සලකා බලන කළ එම අංශයට මෙරට අපේක්ෂණයන් සපුරනු පිණිස එය ඉහළ නැංවීම හා ශක්තිමත් කිරීම සඳහා රජයේ මැදිහත්වීමෙන් උපකාරක යාන්ත්‍රණයක් ඇති කිරීම වැදගත් බව පෙනී යයි.මෙම 'කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුව' ඉහළ විභවයකින් යුතු, බලාපොරොත්තු තැබිය හැකි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීමටත්, වර්තමානයේ ගෝලීයකරණය වූ ආර්ථිකය තුළ ඒවාට සිය පූර්ණ විභවය අත්කර ගැනීමට ඉඩ සැලසීමටත් ඉලක්ක කරයි.මෙම ප්‍රතිපත්ති රාමුව කුඩා ව්‍යවසායන්ට මධ්‍යම ඒවා බවටත්, මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට මහා පරිමාණ ව්‍යවසායන් බවටත්, මහා පරිමාණ ව්‍යවසායන්ට ගෝලීය වශයෙන් තරගකාරී ව්‍යවසායන් බවටත් වර්ධනය වීමට සහයෝගය ලබා දෙයි.

## 2. 'කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුවෙහි' දැක්ම, මෙහෙවර හා අරමුණු

### 2.1 ප්‍රතිපත්තියේ දැක්ම

ජාතික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුවෙහි දැක්ම වන්නේ ජාතික ආර්ථික සංවර්ධනයට දායක වන ගෝලීය වශයෙන් තරගකාරී, ජවසම්පන්න, නව්‍ය, තාක්ෂණ ගාමක, පරිසර හිතකාමී හා තිරසාර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සැලකිය යුතු සංඛ්‍යාවක් බිහි කිරීමයි.

### 2.2 ප්‍රතිපත්තියේ මෙහෙවර

ජාතික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුවේ මෙහෙවර වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට උපකාරී හා හිතකාමී පරිසරයක් සහ තාක්ෂණ භුවමාරුව, ව්‍යවසාය සංස්කෘතිය, කුසලතා සංවර්ධනය, මූල්‍ය පහසුකම් වෙත ප්‍රවිෂ්ඨය, වෙළඳපල පහසුකම් සැළැස්වීම සහ පර්යේෂණ

හා සංවර්ධනය යන මැදිහත්වීම් සමගින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තරග කළ හැකි ගෝලීය මට්ටමේ නිෂ්පාදන හා සේවා නිපදවනු පිණිස එම ව්‍යවසායන්හි වර්ධනය උත්තේජනය කිරීමයි.

## 2.3 ප්‍රතිපත්තියේ අරමුණු

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුව අභිනව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට උපකාර කිරීමටත්, දැනට ඇති ව්‍යවසායන් ශක්තිමත් කිරීමටත්, සාර්ථකව පැවතීමේ විභවය සහිත එහෙත් දුෂ්කර තත්ත්වයක පසු වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ප්‍රතිකර්ම වැඩසටහන් ක්‍රියාවට නැංවීමටත් කටයුතු කරනු ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්තිය පහත අංශ කෙරෙහි සංකේන්ද්‍රණය වෙයි.

- ඉහළ විභවයක් සහිත, ස්ථිරසාර හා ඵලදායක ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය කිරීම සඳහා පර්ෂද ප්‍රවේශය මත සංකේන්ද්‍රණය වීම.පර්ෂද ක්‍රමය යටතේ යෙදවුම් සැපයීමේ සිට පිරිසැකසුම හරහා අපනයනය දක්වා සමස්ත අගය දාමයටම උපකාර කිරීම හා ප්‍රවර්ධනය කිරීම සිදු කෙරෙනු ඇත.
- නිෂ්පාදන සාධක සම්පන්නතාවය හේතුවෙන් දැඩි සාපේක්ෂ වාසි දිරිගන්වන තත්වයක් තුළ ඉහළ අගය එක් කිරීමක් සහිත ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම සහ දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන ව්‍යවසායන් දිරිගැන්වීම.
- අපනයන දිශාභිමුඛ හෝ අපනයන ආදේශක ව්‍යවසායන් හා කර්මාන්ත උද්‍යෝගිමත් කිරීම හා දිරිගැන්වීම.
- රැකියා නිර්මාණය හෝ රැකියා නියුක්ති උත්පාදනය සඳහා පහසුකම් සලස්වනු පිණිස, ඉහළ විභවයෙන් යුතු පිටාර ඵලයන් සහිත ප්‍රමුඛ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයන් දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම.
- නාගරික-ග්‍රාමීය අසමබරතා අඩු කරනු පිණිස පසුගාමී කලාපයන්හි කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම හා යළි ස්ථානගත කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ස්වරූපය හුදෙක් වෙළඳ හා වාණිජ කටයුතු කෙරෙන් ඉහළ අගය එක් කිරීම, නව්‍යකරණය හා උචිත නවීන තාක්ෂණය භාවිතා කිරීම කෙරෙහි විශේෂ අවධානය සහිතව පදනම් වූ නිෂ්පාදන හා කර්මාන්ත දෙසට විපරිණාමනය කිරීම.
- සැම දෙන ඇතුළත් කර ගන්නා ආර්ථික සංවර්ධනය වර්ධනය කරනු පිණිස සහ එමගින් වඩා යහපත් රැකියා නියුක්තිය හා ඉහළ ආදායමක් සඳහා ඉඩප්‍රස්ථා සලසනු පිණිස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ශක්තිමත් කිරීම.
- ශ්‍රී ලංකාව පිසාරා ප්‍රාදේශීය වශයෙන් සමබර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම.
- හරිත තාක්ෂණය භාවිතයද ඇතුළුව සියලුම මට්ටම්වලදී සම්පත් යෙදවීමේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම.

එමෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුව ව්‍යවසාය ගම්මාන, හස්ත කර්මාන්ත ගම්මාන, කාර්මික නිෂ්පාදන ගම්මාන හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කර්මාන්ත

උද්‍යාන/පුර/කලාප ශක්තිමත් කිරීම මගින් සොබාදම් ප්‍රාග්ධනය, හරිත වර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, කාන්තා ව්‍යවසායකත්වය, ශිල්ප අංශය හා ඵලදායක කර්මාන්ත පර්ෂද පවත්වා ගෙන යාම කෙරෙහි විශේෂ අවධානය ලබා දෙනු ඇත.

**1 රූපය: කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමු න්‍යාසය**




## 3. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ නිර්වචනය

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යන වදන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර හැඳින්වීමට භාවිතා කෙරේ. විවිධ රටවල් සිය සංවර්ධන මට්ටම මත පදනම්ව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා එකිනෙකාට වෙනස් නිර්වචනයන් භාවිතා කරති. සුලභව භාවිතා වන මිනුම් ඒකක වන්නේ මුළු සේවක සංඛ්‍යාව, වාර්ෂික පිරිවැටුම හා සමස්ත ආයෝජනයයි. ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුව විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නිර්වචනය කරනු ලබන්නේ සේවක සංඛ්‍යාව හා වාර්ෂික පිරිවැටුම පදනම් කර ගෙන ය.

**1 වගුව: ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නිර්වචනය කිරීම**

| ප්‍රමාණය / අංශය | නිර්ණායකය | මධ්‍යම | කුඩා | ක්ෂුද්‍ර |
|---|---|---|---|---|
| නිෂ්පාදන අංශය | වාර්ෂික පිරිවැටුම (රුපියල් මිලියන) | 251 - 750 | 16 - 250 | 15 ට අඩු |
| | සේවක සංඛ්‍යාව | 51 - 300 | 11 - 50 | 10 ට අඩු |
| සේවා අංශය | වාර්ෂික පිරිවැටුම (රුපියල් මිලියන) | 251 - 750 | 16 - 250 | 15 ට අඩු |
| | සේවක සංඛ්‍යාව | 51 - 200 | 11 - 50 | 10 ට අඩු |

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සේවකයින් 300 කට වඩා අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන, පිරිවැටුම රුපියල් මිලියන 750 නොඉක්මවන ව්‍යවසායන් ගෙන් සෑදී තිබේ. මෙම සන්දර්භය තුළ, ප්‍රතිපත්ති ආශ්‍රිත ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වූ කල ක්ෂුද්‍ර ව්‍යවසායන්ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ගණයේ ලා සැලකේ.

නිර්වචනයන් සම්බන්ධයෙන් ගත් කළ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිර්වචනය කිරීමේදී මෙම නිර්ණායකයන් දෙකම සලකා බලනු ලැබේ. යම් ව්‍යවසායක් එක් ප්‍රභේදයකට වඩා වැඩි ගණනකට වැටෙන කල, තීරණාත්මක සාධකය විය යුත්තේ සේවක සංඛ්‍යාවයි.මෙම ඉහළ සීමාව අදාළ වන්නේ තනි ව්‍යවසායන්ට පමණි. සමාගම් සමූහයක උප සමාගමක් මෙම ගණයට අයත් නොවේ. කෙසේ වුවත් සමාගම් සමූහයේ වාර්ෂික පිරිවැටුම හෝ පූර්ණ කාලීන සේවක සංඛ්‍යාව ඉහත සීමාවන්ට ඇතුලත් වේ නම් එසේ බැහැර කිරීමක් පිළිබඳ ගැටළුවක් පැන නොනගිනු ඇත.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිර්වචනය කිරීමෙහි අරමුණ වන්නේ ප්‍රතිපත්ති ඉලක්ක කිරීම සඳහාත්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ ජාතික සංඛ්‍යාන දත්ත සැපයීම සඳහාත් වූ උපක්‍රමයක් ලබා දීමයි. එය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙනුවෙන් වූ රාජ්‍ය ආධාර සඳහා මගපෙන්වීම පිණිස සහ වඩාත් පුළුල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පරාසයක් ඉලක්ක කිරීම පිණිස වූ පදනමක් වශයෙන් සේවය සලසයි. මෙම නිර්වචනය සෑම අවුරුදු 3 ම වරක් සැලකිල්ලට භාජනය කොට රටෙහි ආර්ථික හා ව්‍යාපාරික සංවර්ධනය මත පදනම්ව අවශ්‍ය පරිදි සංශෝධනය කළ යුතු ය.

## 4. ඉහළ විභවයක් සහිත ඵලදායක පර්ෂද

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ආධාර කිරීමේ හා දිරිගැන්වීමේ කාර්යය සඳහා ඉහළ විභවයක් අපේක්ෂා කළ හැකි ඵලදායක පර්ෂද හඳුනා ගෙන තිබේ. ඵලදායක පර්ෂද නිර්ණය කිරීමේදී අගය එක් කිරීම, දේශීය අමුද්‍රව්‍ය භාවිතා කිරීම, අපනයන දිශාභිමුඛ වීම / අපනය බද්ධතාව, ඉදිරි හා පසු සම්බන්ධක, ඉහළ පිටාර ඵලයන්, තාක්ෂණික ගාමක නිෂ්පාදිත හා රැකියා උත්පාදන පැතිකඩ වැනි නිර්ණායක සලකා බැලේ.

රජය ව්‍යවසායයන්ට උපකාර කිරීමේදී ඇපකැප වූ, හැකියාවැති හා උනන්දුවක් දක්වන යහපත් සේවා වාර්තා සහිත ව්‍යවසායකයින්ට ප්‍රමුඛත්වය දෙනු ඇත. මේ සම්බන්ධයෙන් ව්‍යවසායකයින්ට උපකාර කිරීමෙහිලා ප්‍රමුඛත්වය ලබා දීමේදී "ජයග්‍රාහකයා තෝරා ගැනීමේ" ප්‍රතිපත්තිය අනුගමනය කෙරෙනු ඇත.මෙම"ජයග්‍රාහකයා තෝරා ගැනීමේ" ප්‍රතිපත්තිය මතු දැක්වෙන නිර්ණායක කෙරෙහි නිසි සැලකිල්ල ලබා දෙනු ඇත:- (අ) ව්‍යවසායකයකු වශයෙන් තහවුරු කළ සාක්ෂ්‍ය,(ආ) සාධාරණ හා සැහෙන ප්‍රමාණයක කොටස් ප්‍රාග්ධන සහභාගිත්වය,(ඇ) අදාළ අංශය හෝ පොකුර තුළ අත්කර ගත් කුසලතා හා නිපුණතා,(ඈ) පිළිගත් ගුණාත්මකතා සහතික ක්‍රියාවලියක් සපුරාලීමේ හා පිළිපැදීමේ හැකියාව, (ඉ) නව්‍යකරණයට ඇපකැප වීම සහ(ඊ) කාන්තා ව්‍යවසායකත්වය.

## 5. ප්‍රතිපත්තිමය මැදිහත්වීම සහ ක්‍රමෝපායන්

මෙම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුව මගින් ප්‍රතිපත්ති දිශාව, ආමන්ත්‍රණය කළ යුතු අභියෝග සහ මැදිහත්වීම් ක්‍රමෝපායන්පුළුල්ව දැක්වේ. ප්‍රධාන ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ක්ෂේත්‍රයන් කේන්ද්‍රික ක්ෂේත්‍ර 6කට බෙදා දැක්වේ. එම ක්ෂේත්‍ර 6 වන්නේ: හිතකර පරිසරය, උචිත නවීන තාක්ෂණය, ව්‍යවසායික සංස්කෘතිය හා කුසලතා සංවර්ධනය, මූල්‍ය පහසුකම් වෙත ප්‍රවිෂ්ඨය, වෙළඳපල පහසුකරණය හා පර්යේෂණ හා සංවර්ධනයයි. එමෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීමේදී කලාපීය සමබරතාව හා සම්පත් යෙදවීමේ කාර්යක්ෂමතාව පිළිබඳව අවධානය යොමු කිරීමද වැදගත් වේ.

### 5.1 හිතකර පරිසරය

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):** ශ්‍රී ලංකා රජය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා හිතකාමී පරිසරයක් ස්ථාපනය කිරීමෙහිලා තරඟකාරිත්වය හා සහයෝගය වැඩිදියුණු කරනු පිණිස ව්‍යාපාරික කටයුතු කිරීමේ පහසුව වර්ධනය කිරීමට කාර්ය පටිපාටි සම්බන්ධීකරණය, සරල කිරීම හා තර්කානුකූල කිරීමද ඇතුළුව ව්‍යාවස්ථාදායක, නියාමන හා ආයතනික රාමු සැකැස්ම වැඩිදියුණු කරනු ඇත.

**ආමන්ත්‍රණය කෙරෙන අභියෝග (Challenges Addressed):** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ගනුදෙනු පිරිවැය අඩු කොට ව්‍යාපාර කටයුතු සිදු කිරීමේ පහසුව වැඩිදියුණු කිරීම.

**මූඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා නෛතික පරිසරය ශක්තිමත් කරනු පිණිස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හිතකාමී නීති රීති හා රෙගුලාසි නිර්මාණය කොට පැනවීම සහ ගිවිසුම් බලාත්මක කිරීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ආශ්‍රිත අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා වෙනත් රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතනන්හි ගුණාත්මකතාව හා සේවා ග්‍රාමීය ප්‍රදේශ වලට ගලා යාමට සැලැස්වීම. සමායෝජිත ප්‍රවේශයක් හරහා මූඛ්‍ය අමාත්‍යාංශයන්හි/ නියෝජිතායතනවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට හිතකාමී ඉදිරි කාර්යාල සේවයක් ඇති කිරීම හෝ විශේෂ කවුළුවක් විවෘත කිරීම හෝ සියලු සේවා එකම තැනකින් ලබා දීම කළ යුතු ය.

- පොදු සේවා මධ්‍යස්ථාන, කර්මාන්ත උද්‍යාන හා සම්පත් හා උපදේශන සපයන මධ්‍යස්ථාන ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා සුරැකීම; භූගෝලීය ප්‍රදේශ පාදක පර්ෂද සෑදීම හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ගම්මාන සංවර්ධනය ප්‍රධාන වශයෙන් ඌණ සංවර්ධිත ප්‍රදේශ කෙරෙහි සංකේන්ද්‍රණය වේ.

- වඩාත් සඵලදායී බලගැන්වීම හා නිරත කරවීම සඳහා රාජ්‍ය-පෞද්ගලික සංවාද හා හවුල්කාරිත්ව සංවිධිවිධාන ශක්තිමත් කිරීම සහ කර්මාන්ත සංගම් සංවර්ධනය කිරීම.

- ව්‍යාපාරික හා කර්මාන්ත ඇරඹීමේ හා ආරාවුල් නිරාකරණය කිරීමේ කාර්යපටිපාටි සහ ගිණුම්කරණ ප්‍රමිති සරල කිරීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් තුළ හරිත වර්ධන ඉඩප්‍රස්ථා පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම හා පරිසර හිතකාමී වඩා පවිත්‍ර නිෂ්පාදන තාක්ෂණයන් හා පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

## 5.2 නවීන තාක්ෂණය භාවිතය

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):** රජය ගුණාත්මක, නව්‍ය, ඵලදායී හා තරගකාරී නිෂ්පාදන වැඩි කරනු පිණිස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා නවීන හා උචිත පවිත්‍ර තාක්ෂණය ලබා ගැනීමට හා ඒ වෙත අනුවර්තනය වීමට පහසුකම් සලස්වනු ඇත. කලාපීය කර්මාන්තකරණය මත කේන්ද්‍රගත කරන අතරම, කර්මාන්ත ප්‍රතිපත්තියේ තෙරපුම දැනුම පාදක හා තාක්ෂණ සූක්ෂ්ම කර්මාන්ත කරා දිශාගත කරනු ලැබේ.

**ආමන්ත්‍රණය කරනු ලබන අභියෝග (Challenges Addressed):** උචිත හා දැරිය හැකි නවීන තාක්ෂණය වෙත ප්‍රවිෂ්ඨය දියුණු කිරීම.

**මුඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා නවීන හා පවිත්‍ර තාක්ෂණය ලබා ගැනීමට හා ඒ වෙත අනුවර්තනය වීමට ආධාර කරනු පිණිස වූ උචිත දිරිගැන්වීම් ද සහිතව තාක්ෂණ පැවරුම් හා සංවර්ධන අරමුදල (TTDF) පිහිටුවීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා තාක්ෂණ සම්පාදකයින් අතර ශක්තිමත් ජාලයක්, වේදිකාවක් හා සම්බන්ධයක් ඇති කිරීම.කර්මාන්ත උද්‍යාන තුළ තාක්ෂණ ප්‍රදර්ශන පීඨිකා හා මධ්‍යස්ථාන හරහා සහ විශේෂ තාක්ෂණය විදහා දැක්වීමේ හා ප්‍රචලිත කිරීමේ ප්‍රදර්ශන හරහා තාක්ෂණ පැවරුම් හා බැහැර ව්‍යාප්ති වැඩසටහන් ශක්තිමත් කිරීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විසින් නවීන තාක්ෂණය වෙත අනුවර්තනය වීම ප්‍රවර්ධනය කරනු පිණිස විශේෂ තාක්ෂණ පැවරුම් හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා මෙහෙයවීම. තාක්ෂණ සම්පත් පිළිබඳ තොරතුරු රැස් කිරීම හා ප්‍රචලිත කිරීම සඳහා තාක්ෂණ බැංකුවක් පිහිටුවීම හා ශක්තිමත් කිරීම.වෙළඳපලට සංවේදී වූ පුහුණු අවශ්‍යතා සපුරාලනු පිණිස පාඨමාලා අන්තර්ගතය ඉහළ නැංවීම හා සම්පත් දායකයින්ගේ ධාරිතාව සංවර්ධනය කිරීම මගින් පුහුණු මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.

- නව නිර්මාණශීලී හා තාක්ෂණය මෙහෙය වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හඳුනා ගෙන ප්‍රතිලාභ පිරිනැමීම සහ ඔවුන්ට විදේශ වෙළඳ සල්පිල්වලට, ප්‍රදර්ශනවලට හා තාක්ෂණ ප්‍රදර්ශනය කිරීමේ මණ්ඩපයන්ට සහභාගී වීමට සහාය දීම.

- කර්මාන්ත අංශයේ අවශ්‍යතාවන් සපුරාලනු පිණිස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සමග සාකච්ඡා ක්‍රියාවලියක් පැවැත්වීම මගින්, විශ්වවිද්‍යාල-ව්‍යාපාර සබඳතා පෝෂණය කිරීම හා විශ්වවිද්‍යාල හා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු (TVET) ආයතනවන්හි විෂයමාලාව සංවර්ධනය කෙරෙන බවට වගබලා ගැනීම.

## 5.3 ව්‍යවසායකත්ව සංස්කෘතිය හා කුසලතා සංවර්ධනය

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):** රජයව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, පහසු කිරීම හා ඒ සඳහා උපකාර කිරීමත්, පාසල්වල, විශ්ව විද්‍යාලයන්හි සහ තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනයන්හි ධාරිතා ගොඩනගමින් තරුණ තරුණියන් හා කාන්තාවන් වෙත අවධානය යොමු කිරීමත් සිදු කරනු ඇති අතර, ව්‍යවසායකත්වය හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ එබඳු පුහුණුව ලබා දෙන හා කුසලතා සංවර්ධනය කරන ආයතනයන්හි ධාරිතාව ශක්තිමත් කරනු ඇත.

**ආමන්ත්‍රණය කරනු ලබන අභියෝග (Challenges Addressed):** ව්‍යවසායික කුසලතා, චෛතසිකය හා සංස්කෘතිය ගොඩනැගීම සහ මනෝභාවය (අවදානම් ගැනීමේ ආකල්පය) හා ආයතනික ධාරිතාව දියුණු කිරීම.

**මුඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- ඉල්ලුම මගින් මෙහෙයවනු ලබන තාක්ෂණ හුවමාරුව, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් ශක්තිමත් කිරීම.

- රැකියා සොයන්නන් වෙනුවට රැකියා ඇති කරන්නන් බිහි කරනු පිණිස ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපනික ආයතනයන්හි සහ තාක්ෂණික හා වෘත්තීය පුහුණු වැඩසටහන්වල විෂයමාලාව තුළ ව්‍යවසායිකත්වය,ඒවායේ අගයන්, චින්තනය හා ආකල්ප ශක්තිමත් කිරීම.

- කාන්තා හා තරුණ ව්‍යාවසායකත්වය සංවර්ධනය කරනු පිණිස හා පුහුණු ආයතනයන්හි ආයතනික ධාරිතාව ශක්තිමත් කරනු පිණිස විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- කාන්තා ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම, කාන්තා වාණිජ මණ්ඩල ශක්තිමත් කිරීම හා කාන්තා ව්‍යවසායිකාවන්ට ත්‍යාග දීම වැනි විවිධ ක්‍රියාමාර්ග හරහා කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට හා නව කාන්තා ව්‍යවසායකයින්ට උපකාර කිරීම.

- අභිනවයෙන් ඇරඹෙන ව්‍යාවසායන් හා දැනට ඇති ව්‍යවසායන් සඳහා ගැලපෙන පරිදි සකස් කළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව වැඩසටහන් සහ දුෂ්කර තත්ත්වයට පත්ව ඇති කර්මාන්ත සඳහා ප්‍රතිකර්ම වැඩසටහන් ශක්තිමත් කිරීම.

- ව්‍යවසායක සංවර්ධනය සඳහා හිතකාමී පරිසරයක් ඇති කරනු පිණිස සාර්ථක ව්‍යවසායන් හා සාර්ථක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නිල වශයෙන් පිළිගැනීමට ලක් කිරීම, ත්‍යාග ලබා දීම හා උද්‍යෝගිමත් කිරිම.

- අභියෝග ජයගනිමින් සිය සාර්ථකත්වය කරා ගමන් කල ව්‍යවසායකයින් පිළිබඳ විස්තර, විශිෂ්ටතම පිළිවෙත් හා යොදා ගත් ක්‍රමෝපායන් පිළිබඳව ජනමාධ්‍ය හා වෙනත් මාධ්‍ය හරහා ප්‍රචලිත කිරීම.

- කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන, සංගම්, වාණිජ මණ්ඩල හා ව්‍යවසායකත්වයට උපකාර දක්වන ආයතනයන් ශක්තිමත් කිරීම හා ඒවාට උපකාර කිරීම සහ කීර්තිමත් අධ්‍යාපනික ආයතන තුළ ව්‍යාවසාය බිහිකිරීමේ කේන්ද්‍ර ප්‍රවර්ධනය කිරීම.

- ණය පහසුකම් සඳහා අවශ්‍ය වන ව්‍යාපෘති වාර්තා හා ශක්‍යතා වාර්තා පිළියෙළ කිරීම, තාක්ෂණික තොරතුරු, උපදේශක සේවාවන්, පර්යේෂණාගාර සේවාවන් හා තත්ත්වය සහතික කිරීමේ සේවාවන් ලබා දීම වැනි වැදගත් සේවාවන් ආවරණය කරනු පිණිස ව්‍යාප්ති සේවාවන් ශක්තිමත් කිරීම.සාර්ථකව පැවතීමේ විභවය සහිත එහෙත් දුෂ්කර තත්ත්වයක පසු වන කර්මාන්ත දිස්ත්‍රික්කවල ඇති පුනර්ජීවන අරමුදල හරහා උපකාර කොට පෙර තත්ත්වයට ගෙන ඒම.
- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ ඇති සංකල්ප, අවශ්‍යතා හා ඉඩප්‍රස්ථා පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම මගින් සාමාජීය ව්‍යවසායකත්වය, ආචාර සම්පන්න නිෂ්පාදනය හා සාධාරණ වෙළඳ නාමකරණය සඳහා උපකාර කිරීම.

## 5.4 මූල්‍ය පහසුකම් වෙත ප්‍රවිෂ්ඨය

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):** රජය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හට පහසුවෙන් හා දැරිය හැකි පිරිවැයකට මූල්‍ය පහසුකම් වෙත ප්‍රවිෂ්ට වීමේ හැකියාව ලබා දීම සඳහා වූ යාන්ත්‍රණ සඳහා පහසුකම් සැලැස්වීම, ඒවාට ආධාර කිරීම හා ඒවා ශක්තිමත් කිරීම සිදු කරනු ඇත.

**ආමන්ත්‍රණය කරනු ලබන අභියෝග (Challenges Addressed):** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට නවීකරණය, පුළුල් කිරීම හා සාර්ථක ලෙස මෙහෙයුම් පවත්වා ගෙන යාම සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් වෙත ප්‍රවිෂ්ඨය.

**මුඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- ණය වෙත ප්‍රවිෂ්ඨ වීම පහසු කරවනු පිණිස බැංකු, මූල්‍ය ආයතනයන් හා කල්බදුකරණ සමාගම් තුළ විශේෂ ණය සඳහා වෙන් කෙරෙන මුදල් ප්‍රමාණය ඉහළ දැමීම හා විශේෂ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවුළු විවෘත කිරීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ප්‍රති-මූල්‍යකරණ යෝජනා ක්‍රම, බැංකු සායන, මහා භාණ්ඩාගාර වගකීම් සහතිකය හා ඇප සුරැකුමක් නොමැති පදනමෙන් ණය වෙත ප්‍රවිෂ්ඨය පුළුල් කිරීම.

- ස්ථිරසාර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් තුළට කොටස් ප්‍රාග්ධන සහභාගිත්වය පිවිසවනු පිණිස ව්‍යාපාරය ප්‍රාරම්භක අවදියේදී අරමුදල් සපයන ඒන්ජල් අරමුදල් (Angle Funds) හා ව්‍යාපාර ප්‍රාග්ධන සංවිධිවිධාන ප්‍රවර්ධනය කිරීම.

- කාන්තා හා තරුණ ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම පිණිස සහනදායී බැංකු ණය යෝජනාක්‍රමවල පරිමාණය වැඩි කිරීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත සංකේන්ද්‍රණය වූ බැංකු ණය දීම් හා ඇගැයීම් ක්‍රම සමගින් බැංකු හා මූල්‍ය ආයතනයන් හි නිලධාරීන්ගේ ධාරිතාව හා කුසලතා ශක්තිමත් කිරීම.

- ව්‍යාපාරික සැලැස්ම පිළියෙළ කිරීම, ගිණුම්කරණය හා පොත් තැබීම සහ තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් ගිණුම්කරණ කට්ටල භාවිතය වැනි මූල්‍යකරණ මාතෘකා සම්බන්ධයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ධාරිතාව හා කුසලතා ශක්තිමත් කිරීම. ණය තොරතුරු කාර්යාංශය, ව්‍යාපාරික සංවර්ධන සේවා සම්පාදකයින්, ව්‍යාපාරික මණ්ඩල, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය සහ ආශ්‍රිත ගිණුම්කරණ ආයතන හා ශ්‍රී ලංකා බැංකුකරණ ආයතනය වැනි උපකාරක ව්‍යුහයන් ශක්තිමත් කිරීම.

## 5.5 වෙළඳපල පහසුකම් සැලැස්වීම

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):** ජාත්‍යන්තරීකරණය කිරීමෙහි වැදගත්කම රජය හඳුනා ගෙන ඇති අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට දේශීය හා අපනයන වෙළඳපල වෙත ප්‍රවිෂ්ඨ වීමට පහසුකම් සැලැස්වීම හා උපකාර කිරීම කරනු ඇත.

**ආමන්ත්‍රණය කරනු ලබන අභියෝග (Challenges Addressed):** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට දේශීය හා ගෝලීය වෙළඳපල වෙත පිවිසීමට හැකියාව ඇති කරනු පිණිස නිෂ්පාදන ගුණාත්මකතාව, ඇසුරුම්, වෙළඳ ලකුණු හා නාම වඩාත් දියුණු කිරීම සහ වෙළඳපල තොරතුරු ලබා දීම.

**මූඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට වෙළඳපල තහවුරු කරනු පිණිස, විශාල ව්‍යවසායන් හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අතර ව්‍යාපාරික සබඳතා ප්‍රවර්ධනය කොට ගැනුම්කාර-අලෙවිකාර රැස්වීම් සඳහා හා ආපසු මිලට ගැනීමේ හා උප කොන්ත්‍රාත් සංවිධාන සඳහා පහසුකම් සැලැස්වීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන හරහා ජාත්‍යන්තර වෙළඳපලට සහභාගි වීමට උපකාර කිරීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ජාත්‍යන්තර වෙළඳපලට පිවිසීමට එතෙර වෙළඳපල තොරතුරු ලබා ගැනීමට සලස්වනු ඇත. අපනයනකරුවන්ට එතෙර වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශනවලට සහභාගි වීම සඳහා සහන ලබා දීම හරහා තාක්ෂණික උපකාර ලබා දෙනු ඇත.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා විශේෂයෙන්ම සංචාරක හා අධික ලෙස ජනයා පැමිණෙන ස්ථානවල මාර්ගය දෙපස අලෙවිසල් ව්‍යාප්ත කරනු ඇත.

- රජයේ ප්‍රසම්පාදනයන් තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ වෙළඳපල කොටස වැඩි කර ගැනීමට සහාය වනු පිණිස ප්‍රසම්පාදන ප්‍රමුඛතා ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අපනයනකරුවන් හා ගැනුම්කරුවන්ට සම්බන්ධ වී සිය වෙළඳපල ජාලය ශක්තිමත් කර ගැනීමට හැකියාව ලබා දෙනු පිණිස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙබ් අඩවිය හා විද්‍යුත් වෙළඳ සංවිධිවිධාන ස්ථාපිත කිරීම

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තරග කිරීමට සිය නිෂ්පාදන සංවර්ධනය, ගුණාත්මකතා වර්ධනය, ආචාර සම්පන්න පිළිවෙත්, ඇසුරුම්, වෙළඳනාම හා වෙළඳපල ජාල ඇති කර ගැනීමට උපකාර කිරීම

## 5.6 පර්යේෂණ හා සංවර්ධනය

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):** නිෂ්පාදන සංවර්ධනය, පිරිසැකසුම් සංවර්ධනය, නිෂ්පාදන ඵලදායිත්වය දියුණු කොට තරගකාරිත්වය වැඩි කිරීමේ අරමුණින් පිරිවැය කාර්යක්ෂම නව තාක්ෂණයන්, නව්‍යකරණයන් හා වෙළඳපල දිශාභිමුඛ නව නිර්මාණයන් සංවර්ධනය කර ගැනීමේ බලසම්පන්න ක්‍රියාවලියක් වශයෙන් පර්යේෂණයේ හා සංවර්ධනයේ ඇති වැදගත්කම රජය හඳුනා ගෙන සිටී.

**ආමන්ත්‍රණය කෙරෙන අභියෝග (Challenges Addressed):** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට වඩාත් කාර්යක්ෂම හා තරගකාරී වීමට උපකාර කරනු පිණිස පිරිවැය කාර්යක්ෂම මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට දැරිය හැකි නවීන තාක්ෂණයන් හා ව්‍යවහාරික පර්යේෂණ සංවර්ධනය කිරීමෙහිලා කර්මාන්ත, පර්යේෂණ ආයතන හා විද්වත් ආයතන අතර වඩා විශාල හවුල්කාරිත්වය

**මුඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- කර්මාන්ත හා පර්යේෂණ ආයතන අතර වඩා සමීප සම්බන්ධයන් ස්ථාපනය කිරීම හා කර්මාන්තයට අදාළ ව්‍යාවහාරික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වාණිජමය වශයෙන් වර්ධනය කිරීම සඳහා පර්යේෂණ යොදා ගැනීම
- නිෂ්පාදනයන්හි කල් ඉකුත් වීමේ කාලය දීර්ඝ කිරීම පිණිස කල් තබා ගැනීමේ තාක්ෂණයන් හා ගුණාත්මකතාව දියුණු කිරීම කෙරෙහි පර්යේෂණ කේන්ද්‍රගත කිරීම. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ගුණාත්මකතාව තහවුරු කිරීමේ හා ප්‍රමිති සහතික කිරීමේ පද්ධතිය ආයතනගත කිරීම.
- ජාත්‍යන්තර වෙළඳපල වෙත පිවිසෙනු පිණිස ගුණාත්මකතාව තහවුරු කරනු පිණිස පර්යේෂණාගාර හා පරීක්ෂණ පහසුකම් ලබා දීම.
- අමුද්‍රව්‍ය හිඟය පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කරනු පිණිස විකල්ප ආදේශක අමුද්‍රව්‍ය සොයා ගැනීම උදෙසා වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- උචිත මූල්‍ය පාලන දිරිදීමනා හරහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල පර්යේෂණ හා සංවර්ධනය සඳහා ආයෝජන වැඩි කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් කෙරෙහි නාභිගත වූ පර්යේෂණ හා සංවර්ධනය සඳහා උපකාර කරනු පිණිස විශේෂ අරමුදලක් ස්ථාපිත කිරීම.
- ව්‍යවහාරික පර්යේෂණයන්හි නිරත වන රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් පිළිගැනීමට ලක් කොට ත්‍යාග ලබා දීම හා පර්යේෂකයින්ට හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට හා ඒවා වාණිජකරණය කිරීමට සහාය වීම.
- ප්‍රමිතිකරණය, ප්‍රතීත සහතිකකරණය, මිතිකවේදය, ගුණාත්මකතා කළමනාකරණය හා ප්‍රතිමාන සැකසීම තුළ නිරත රාජ්‍ය ආයතනයන්හි ධාරිතා ගොඩනැගීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මත නාභිගත වූ පර්යේෂණ හා සංවර්ධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම හා පර්යේෂණ හා සංවර්ධනය දිරිගැන්වීම සඳහා දිරිදීමනා ලබා දීම.

## 5.7 සම්පත් කාර්යක්ෂම ලෙස යෙදවීම

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):** රජය සම්පත් කාර්යක්ෂමතාව වැදගත් ලෙස සලකනුයේ එය පිරිවැය ඉතිරි කිරීමෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි තරගකාරිත්වය දියුණු කරන නිසා සහ එය ස්වභාවික පරිසරය සුරැකීමට උපකාරී වෙමින් අනාගත සංවර්ධනය සඳහා තිරසාර පදනමක් පවත්වා ගෙන යන බැවිනි.

**ආමන්ත්‍රණය කරනු ලබන අභියෝග (Challenges Addressed):** ශ්‍රී ලංකාවට සිය සමාජ ආර්ථික සංවර්ධනයේ හා සමස්ත යහපැවැත්මේ පදනම වශයෙන් සේවය සලසන සාරවත් ස්වභාවික සම්පත් උරුම වී තිබුණද, එය වැඩි වැඩියෙන් තර්ජනයට ලක් වන අතර එය ආරක්ෂා කොට යලි ගොඩනැංවිය යුතු ය. දැනුවත්භාවය හා කුසලතා දියුණු කිරීම තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සම්පත් කාර්යක්ෂමතාවෙහි හා ප්‍රතිචක්‍රීකරණයේ කෙටි හා දීර්ඝ කාලීන ප්‍රතිලාභ මෙන්ම ගෝලීය වෙළඳපලෙහි හරිත තාක්ෂණයට ඇති විශාල ආර්ථික ඉඩප්‍රස්ථා ද ප්‍රයෝජනයට ගැනීමට දිරිගැන්විය යුතු ය.

**මුඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- සේවා සම්පාදකයින් හා දැනට ඇති ආයතන ශක්තිමත් කිරීම මගින් සම්පත් කාර්යක්ෂම සේවාවන් සඳහා වූ සැපයුම හා ඉල්ලුම දියුණු කිරීම, හරිත තාක්ෂණයන් සඳහා නිපුනතාවය සහිත ශ්‍රමිකයින් පුහුණු කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අතර දැනුවත්භාවය වර්ධනය කිරීම.

- පවිත්‍ර තාක්ෂණය සඳහා දිරිගැන්වීම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සහ ආයතනික බාධකයන් මගහරවා ගැනීමට පහසුකම් සැලැස්වීම.

- සියලුම මට්ටම්හිදී රජයේ හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මගින් තිරසාර ලෙස නිපදවන ලද නිෂ්පාදන සඳහා ඉල්ලුමක් ඇති කිරීම සහ පරිසරයේ වාසි පිළිබඳ දැනුවත්භාවය ඇති කරනු පිණිස මාධ්‍ය ව්‍යාපාර ප්‍රචලිත කිරීම.

- ප්‍රතිචක්‍රීකරණ පද්ධති දියුණු කිරීම, ද්‍රව්‍ය ප්‍රවාහ විශ්ලේෂණය පිළිබඳව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දැනුවත් කිරීම හා නීති රීති හා රෙගුලාසිවලට පුළුල් නිෂ්පාදක වගකීම් විධිවිධාන අන්තර්ග්‍රහණය කිරීම.

## 5.8 ප්‍රාදේශීය සමබරතාව

**ප්‍රතිපත්ති පර්යාලෝකය (Policy Perspective):**සමස්ත ආර්ථික සංවර්ධන ක්‍රමෝපාය අංශයෙන් සමබර ප්‍රාදේශීය වර්ධනයක් අත්කර ගැනීමේ වැදගත්කම රජය හඳුනා ගෙන ඇත.

**ආමන්ත්‍රණය කරනු ලබන අභියෝග (Challenges Addressed):** ප්‍රාදේශීය වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙන අතර තොරතුරු, තාක්ෂණය හා පුහුණුව වෙත ප්‍රවිෂ්ඨය හා ව්‍යාපාරික සේවා සම්පාදකයින් සම්බන්ධ දැනුවත්භාවය හා ධාරිතාව ශක්තිමත් කෙරේ.

**මුඛ්‍ය ක්‍රමෝපායන් (Key Strategies):**

- විවිධ දිරිදීමනා යෝජනාක්‍රම සමගින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල මූල්‍ය හා මූල්‍ය නොවන ව්‍යාපාරික සංවර්ධන සේවා (BDS) සම්පාදකයින් සඳහා ඉල්ලුම හා සැපයුම දියුණු කිරීම.
- තොරතුරු හා සේවාවන් ජාතික භාෂාවන්ගෙන් (සිංහල හා දෙමළ) ලබා ගැනීමට සැලැස්වීම.
- විශේෂයෙන් තාක්ෂණය හා නව්‍යකරණය පිළිබඳ ව්‍යාපාරික සංවර්ධන සේවා සම්පාදකයින් සිටීම හා ඔවුන්ගේ ප්‍රයෝජනය පිළිබඳව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අතර දැනුවත්භාවය ඇති කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විශාල ආයතන, විදේශීය සෘජු ආයෝජන හා ආයෝජන මණ්ඩල සමාගම් සමග සම්බන්ධ කිරීම.
- කලාපයන් තුළ දැනට ඇති කර්මාන්ත කලාප හා පර්ෂද වර්ධනය කිරීම හා නව ඒවා පිහිටුවීම.

## 6. ක්‍රියාත්මක කිරීමේ සංවිධිවිධාන

### 6.1 ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සම්බන්ධීකරණය

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම හා පහසුකම් සැලැස්වීම පිණිස වගකියන තනි සම්බන්ධීකරණ ආයතනයක් තිබීම වැදගත් ය.මේ සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් කැඳවනු ලබන මුදල් අමාත්‍යාංශය ඇතුළු වෙනත් පර්ෂද අමාත්‍යාංශ සහ ආයතන හා කොටස්කරුවන් ඇතුළත් අන්තර්-අමාත්‍යාංශ සම්බන්ධීකරණ මණ්ඩලයකට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සම්බන්ධීකරණය, පහසුකම් සැලැස්විම හා අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම පැවරෙනු ඇත.

ආයතනික වශයෙන් ද්වතියීකකරණය මග හරවා ගැනීම සඳහා මේ සම්බන්ධයෙන් වෙනත් ආයතනය සැලැස්මක් ස්ථාපනය කිරීමට ප්‍රථම දැනට පවතින ආයතන යෝග්‍ය පරිදි ප්‍රතිව්‍යුහගත කිරීම වඩාත් සුදුසු වේ.

එමෙන්ම යෝජිත තාක්ෂණ පැවරුම් හා සංවර්ධන අරමුදලෙහි (TTDF) අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක වන තාක්ෂණ හා පර්යේෂණ ආයතන ජාලය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වශයෙන් සඳහන් කල හැක.

### 6.2 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය උපදේශක සභාව

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ක්‍රමෝපාය සැකසීම සඳහා රජය ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක්, බුද්ධි මණ්ඩලයක් පිහිටුවනු ඇත. මෙම සභාව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ශක්තිමත් කරනු පිණිස උචිත කර්මාන්ත කලාප / උද්‍යාන, පොදු සේවා මධ්‍යස්ථාන, ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහන, වෙළඳපල සඳහා පහසුකම්

සැලැස්වීමේ වැඩසටහන්, මූල්‍ය උපකාර මූලකෘත්‍යයන්, ව්‍යාපාර ප්‍රාග්ධන ආකෘතීන් හා වෙනත් මූලකෘත්‍යයන් ඇති කිරීම සඳහා වූ නව අදහස්, යෝජනා හා ක්‍රමෝපායන් ඉදිරිපත් කරනු ඇත.

එමෙන්ම උපදේශක සභාව බැංකු සමග ඒකාබද්ධව දුර්වල තත්ත්වයේ පසුවන කර්මාන්ත ආයතනයන්හි පැවතීමේ හැකියාව යළි විමර්ශනය කොට සුදුසු පුනරුත්ථාපන යෝජනාවලි ක්‍රියාත්මක කිරීමෙහිලා උපකාර කරනු ඇත.උපදේශක සභාව පහත කාරණාවන් පිළිබඳවද සලකා බලනු ඇත:-

- මෙම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමුව උචිත කාර්ය සැලැස්මක් අනුව ක්‍රියාවේ යෙදවීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය කිරීම සඳහා පුළුල් ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම.
- වත්මන් ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා සැලැස්ම සමාලෝචනය කොට නව්‍ය ක්‍රමෝපායන් හා මැදිහත් වීම් පිළිබඳව උපදෙස් දීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ක්‍රමෝපාය ප්‍රමුඛත්වයන් හා පිරිවැය කාර්යක්ෂම සේවා පිරිනැමීම් පිළිබඳව අවධානය යොමු කරනු පිණිස ආයතනික සැකැස්ම ප්‍රතිව්‍යුහගත කිරීම.
- ප්‍රතිඵල වඩා යහපත් කරනු පිණිස ව්‍යාපෘති හා වැඩසටහන් ද ඇතුළුව ක්‍රමෝපායන්හි අදාළත්වය, කාර්යක්ෂමතාව හා සඵලදායකත්වය සමාලෝචනය කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි මතුවන ගැටළු පිළිබඳව උපදෙස් දීම හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## 6.3 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පර්ෂද කමිටු

පර්ෂදවල ගැටළු හා සහාය අවශ්‍ය වන ක්ෂේත්‍ර කවරේදැයි සාකච්ඡා කිරීමටත්, ඒ ඒ අංශවල ප්‍රගතිය පිළිබඳව සංවාදයට හා සාකච්ඡාවට භාජනය කිරීමටත්, ක්‍රමෝපායන් හා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සැකසීමෙහිලා සහාය වීමටත් රජය ක්‍රමෝපායික වශයෙන් වැදගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පර්ෂද කමිටු පිහිටුවනු ඇත. මෙම පර්ෂද කමිටු නොහොත් මඩුලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, පෞද්ගලික අංශය, ව්‍යාපාරික මණ්ඩල, කර්මාන්ත සංගම්, විද්වත් ප්‍රජාව හා අදාළ කර්මාන්ත අංශය නියෝජනය කරන නියෝජිතයින් ගෙන් සමන්විත වනු ඇත.මෙම පර්ෂද කමිටු මූලික වශයෙන් ප්‍රතිපත්ති ලියැවිල්ලෙහි හඳුනා ගනු ලැබූ ඉහළ විභවයෙන් යුතු ඵලදායක ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ඇත.කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ දුක්ගැනවිලි හදිසි පදනමින් ආමන්ත්‍රණය කරනු පිණිස සහන යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරෙනු ඇත.

මෙම පර්ෂද කමිටු පර්ෂදයන්හි ඇති තාක්ෂණය, අමුද්‍රව්‍ය, අලෙවිකරණය හා මූල්‍යකරණය වැනි ගැටළු සාකච්ඡා කොට, අදාළ ක්ෂේත්‍රයට කර්මාන්තය තුළ අනෙක් නිෂ්පාදන සමග තරග කළ හැකි වඩාත් සමතල තරග ක්ෂේත්‍රයක තබනු පිණිස සුදුසු ක්‍රමෝපායන් හා මැදිහත් වීම් නිර්මාණය කොට සම්පාදනය කරනු ඇත.පර්ෂද කමිටු ආයෝජන ක්‍රමෝපායන්, රාජ්‍ය-පෞද්ගලික කාර්යවිධි, මූල්‍ය දිරිගැන්වීම්, ගාස්තු අනුපාතික ක්‍රියාමාර්ග, ණය, ඉදිරි හා පසු සම්බන්ධතා ඇතුළු මූල්‍යකරණ කාර්යවිධි, සැපයුම් දාම ආශ්‍රිත මැදිහත් වීම් සහ අංශයෙහි ක්‍රමෝපායික ප්‍රතිදාන හා ප්‍රතිඵල සාක්ෂාත් කර ගනු පිණිස අත්‍යවශ්‍ය හෝ උපකාරී වන අන් කවර හෝ මුඛ්‍ය පැතිකඩයන් නිර්දේශ කළ යුතු ය.

## 6.4 නිරීක්ෂණය හා ඇගැයීම

යෝජිත අන්තර්-අමාත්‍යාංශ සම්බන්ධීකරණ මණ්ඩලය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති නිරීක්ෂණ හා ඇගැයීම් කමිටුව (PMEC) වශයෙන් කටයුතු කරනු ඇති අතර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රගතිය හා ප්‍රතිදානය තක්සේරු කරනු පිණිස වූ ත්‍රෛමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ඇත. කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති නිරීක්ෂණ හා ඇගැයීම් කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් ක්‍රියාත්මක වනු ඇත.

තවද නියමිත කාලයකට වරක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ප්‍රගතිය, ඒවායේ අභියෝග, ගැටළු හා බාධක පිරික්සනු පිණිස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමීක්ෂණය දියත් කරනු ලැබිය යුතු ය.

## 7. සමාප්තිය

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අප ආර්ථිකයේ කොඳුනාරටියයි. එම නිසා ශ්‍රී ලංකා රජය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්ති රාමු සැකැස්මක් මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා හැකි විශිෂ්ඨතම පොදු තත්ත්වයන් ඇති කිරීමට අපේක්ෂා කරයි. මෙම ප්‍රතිපත්තිය මගින් කුඩා ව්‍යවසායන්ට මධ්‍ය පරිමාණ ඒවා බවටත්, මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට විශාල ඒවා බවටත් වර්ධනය වීමට මහෝපකාරී වන බව රජය දැඩි සේ විශ්වාස කරයි.මෙහි මූලික විධිවිධානයන්හි පූර්ණ වාසිය ලබා ගෙන සිය පූර්ණ විභවය සාක්ෂාත් කර ගැනීමේ කාර්යය පෞද්ගලික අංශය සතු ය.